ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය

இலங்கை அரசாங்க சேவை வீளையாட்டுச சங்கம்

Sri Lanka Government Service Sports Society

No. 2/12, 2/16, Polhengoda Road, Narahenpita, Colombo 05.

Tel & Fax : 011-2513012 Email : srilankagsss.2024@gmail.com

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් / දෙපාර්තමේන්තු ප්‍රධානීන් / දිස්ත්‍රික් ලේකම්වරුන් / ප්‍රාදේශීය ලේකම්වරුන් / පළාත්සභා සහ පළාත්පාලන ආයතන ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් වෙත.

මහත්මයාණෙනි / මහත්මියනි,

රාජ්‍ය සේවා කැරම් තරඟාවලිය - 2026

ශ්‍රී ලංකා රාජ්‍ය සේවා සංගමය වාර්ෂිකව පවත්වනු ලබන රාජ්‍ය සේවා කැරම් තරගාවලිය 2026 දෙසැම්බර් මස 02 හා 03 යන දිනවලදී ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය, 2/12, පොල්හේන්ගොඩ පාර, නාරාහේන්පිට දී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

තරඟාවලියේ කොන්දේසි පහතින් දැක්වේ.

1. රාජ්‍ය සේවයේ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත නිලධාරීන්/ නිලධාරිනියන්ගෙන් සමන්විත රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්/නිලධාරිනියන් හට මෙම තරඟාවලියට සහභාගී විය හැක. රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගෙන ඇති අර්ධ රාජ්‍ය සේවා ආයතන වල ස්ථිර නිලධාරීන් සඳහා ද මෙම තරඟාවලිය විවෘත වේ.
2. මෙම තරඟාවලිය පිරිමි A,B,C වශයෙන් කාණ්ඩ 03 කට අයත් වන අතර, කාන්තා අංශය ප්‍රවීන /ආධුනික වශයෙන් කාණ්ඩ දෙකක් වේ.
3. එක් කාණ්ඩයක් වෙනුවෙන් පිරිමි කණ්ඩායම් 02 ක් ඉදිරිපත් කල හැකි අතර, එකම ක්‍රීඩකයෙකුට /ක්‍රීඩිකාවකට කණ්ඩායම් 02 කට ම ඉදිරිපත් විය නොහැක.
4. A කාණ්ඩයෙන් තරඟ කල හැක්කේ B කාණ්ඩයෙන් ජයග්‍රහණය කර ඇති කණ්ඩායම් වලට සහ පසුගිය වසරවල අඛණ්ඩව A කාණ්ඩයෙන් තරඟ කර ඇති කණ්ඩායම් වලට පමණි.
5. B කාණ්ඩයෙන් තරඟ කල හැක්කේ පසුගිය වසරේ C කාණ්ඩයේ අවසන් තරඟ සඳහා සුදුසුකම් ලැබූ කණ්ඩායම් 02 ක සහ දැනටමත් B කාණ්ඩයෙන් තරඟ කරන කණ්ඩායම් සඳහා පමණි.
6. තවද B කාණ්ඩයෙන් තරඟ කර 2 වන වටය සඳහා සුදුසුකම් නොලැබූ කණ්ඩායම් සඳහා අවශ්‍ය නම් C කාණ්ඩයේ තරඟ කල හැක.
7. තරඟාවලිය සඳහා මුල්වරට ඉදිරිපත් වන සහ පසුගිය වසර 03 ක් අඛණ්ඩව ඉදිරිපත් නොවූ කණ්ඩායම් හා දැනටමත් C කාණ්ඩයේ තරඟ කරන සියලුම කණ්ඩායම් C කාණ්ඩයේ තරඟ කල යුතුය.
8. සියලුම තරඟ පිළිමළුන් පිටුදැකීමේ ක්‍රමය යටතේ පැවැත්වෙන අතර, පිරිමි කණ්ඩායම් තරඟ ඒකල තරඟ 03 ක් හා යුගල තරඟ 02 ක් ලෙස පැවැත්වේ. මුලින් ඒකල තරඟ 02 ක් පවත්වා යුගල තරඟ 02 ක පැවැත්වේ. සම උවහොත් ඒකල තරගයක් පැවැත්වේ.ඒ සඳහා කලින් තරඟ නොකල ක්‍රීඩකයා නම් කල යුතුය. කාන්තා තරඟාවලියේ ඒකල තරඟ 02ක් හා යුගල තරඟයක් පැවැත්වේ. (පළමු ඒකල තරඟ 2ක සඳහා සහභාගි වූ තරඟ කරුවන් දෙදෙනාට එකට යුගල තරඟ සඳහා සහභාගි විය නොහැක.)
9. පිරිමි කණ්ඩායම් සඳහා තරඟකරුවන් පස්දෙනෙකු (05) ඇතුලත් කල හැකි අතර, කාන්තා කණ්ඩායමකට තරඟකාරියන් තිදෙනෙකු (03) ඉදිරිපත් කල හැක.
10. සියලුම තරඟ කැරම් සම්මේලනයේ නීතිරීති වලට අනුකූලව කැරම් පුවරුවල පවත්වනු ලබන අතර, කැරම් ඩිස්ක් තරඟකරුවන් රැගෙන ආ යුතුය.මෙම තරඟ වාර 08 කින් (8 Board) හෝ පැයක කාලයකට (One Hour Time Limit) සීමා වේ.
11. තරඟ විනිසුරුවන්ගේ තීරණය අවසන් තීරණය වන අතර, සියලු තරඟ කරුවන්/ තරඟකාරිනියන් එම තීරණය පිළිගැනීමට බැඳී සිටිය යුතුය. තරඟාවලියේ අවසන් තීරණ සංවිධායක කමිටුව සතුවේ.

12. විරෝධතා සඳහා අදාල තරඟය නිම වී විනාඩි 30 ක් ගත වීමට පෙර ලිඛිතව දැනුම් දිය යුතුය. විරෝධතා ගාස්තුව රු.1000.00 කි.
13. සියලුම තරඟකරුවන්/ තරඟකාරියන් තම අනන්‍යතාවය සහ රාජ්‍ය සේවයේ නියුතු බවට ඔප්පු කිරීම සඳහා සේවා හැඳුනුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැති අය ජාතික හැඳුනුම්පත සමඟ අදාල ආයතනයේ ස්ථිර සේවය කරන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කරන ලද ලිපියක් ඉදිරිපත් කළ යුතුය.එසේ නොමැති නම් තරග සඳහා ඉදිරිපත් විය නොහැක.
14. මෙම තරඟාවලිය සඳහා ඇතුලත් වීමේ ගාස්තුව රු.5000/- ක් වන අතර අමතර කණ්ඩායමක් ඉදිරිපත් කරන්නේ නම් ඒ සඳහා රු 2000/- ක මුදලක් අයකෙරේ.(එක් කාණ්ඩයක පළමු කණ්ඩායම සඳහා අයකරන මුදල රු.5000/- කි) එම ගාස්තු හැටන් නැෂනල් බැංකුව, නාරාහේන්පිට ශාඛාව, ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය නමින් ගිණුම් අංක 104010002466 ගිණුම් අංකයට බැර කොට රිසිට් පතේ ඡායා පිටපතක් අයදුම් පත්‍රය සමඟ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර ඉදිරිපත් කළ යුතු අතර රිසිට්පත තරග ලේකම් වෙත වට්ස්ඇප් කල යුතුය.එසේ නොමැති නම් අයදුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
15. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2026.11.20 වන දින වන අතර, තරඟ කාල සටහන් සකස් කිරීමෙන් අනතුරුව තැපැල් මඟින් හෝ දුරකථන, වට්ස්ඇප් මඟින් ඇමතුමක් මඟින් දැනුම් දෙනු ලැබේ.
16. අයදුම්පත් භාර දීම පරිපාලන ලේකම්, ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය, 2/12, පොල්හේන්ගොඩ පාර, නාරාහේන්පිට ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය හැක.
17. මෙම තරඟාවලිය පිළිබඳ තොරතුරු දැනගැනීම සඳහා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමයේ ගරු කැරම් ලේකම් කේ.කේ.ආර්.කුමාර මහතා හෝ ගරු පරිපාලන ලේකම් රම්‍යනාත් රත්නායක මහතා (දුරකථන අංකය 0112513012) අමතා වැඩිදුර තොරතුරු දැන ගත හැක.
18. එක් එක් තරඟ කාණ්ඩයන් සඳහා අවම වශයෙන් කණ්ඩායම් 05 ක් වත් ඉදිරිපත් වී නොතිබුණහොත් එම කාණ්ඩයේ තරඟ අවලංගු කරන අතර, අයදුම්පත් ගාස්තු නැවත ගෙවනු ලැබේ.
19. රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගෙන ඇති අර්ධ රාජ්‍ය සේවා ආයතනවල ස්ථිර සේවකයින් සඳහාද මෙම තරගාවලිය විවෘත වේ.
20. මෙම කැරම් තරඟාවලිය සඳහා සහභාගී වන රාජ්‍ය නිලධාරීන් තම තමන්ගේ බඩු බාහිරාදිය ප්‍රවේශම් කර ගැනීමට ද වග බලා ගත යුතු අතර, නැති වීම් අස්ථාන ගතවීම් පිළිබඳව රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය ඊට වග කියනු නොලැබේ.
21. තරගාවලිය සඳහා නම් ඉදිරිපත් කිරීමේදී සම්පූර්ණ නම් ඉදිරිපත් කල යුතු අතර යම් තරගයක් ජයග්‍රහණය කර ඇති අවස්ථාවක නම නිවැරදිව සඳහන් නොකර සහතිකපත් ලිවීමේදී වැරදීමක් සිදුවී ඇතැයි සඳහන් කලහොත් නැවත සහතික පතක් නිකුත් කිරීම සඳහා රු.500 ක මුදලක් අය කරනු ලැබේ.
22. සියලුම තරගකරවන් තරග පවත්වන දින පෙ.ව 08.30 වනවිට නො.2/12, පොල්හේන්ගොඩ පාර, නාරාහේන්පිට ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය, වෙත වාර්ථා කල යුතුය.

ඉහත කොන්දේසි කඩ කිරීම තරඟාවලියෙන් ඉවත් කිරීමට හේතු වන කරුණක් බව කාරුණිකව දැනුම් දෙමි.

කේ.කේ.ආර්.කුමාර
රාජ්‍ය සේවා කැරම් ලේකම්
රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය
071 – 4408653 / 071-2048663

අත්/කලේ-එම්.ජේ.පී.පෙරේරා
ප්‍රධාන ලේකම්
රාජ්‍ය සේවා ක්‍රීඩා සංගම
0703079421

President
G.L. Sajith Jayalal
Director,
National Institute of Sports Science,
#100/7, Independence Avenue,
Colombo - 07.
Mobile : 071 420 7008

General Secretary
M. Judith Priyani Perera
Library Information Officer,
National Institute of Sports Science,
#100/7, Independence Avenue,
Colombo - 07.
Mobile : 070 307 9421

Treasurer
M.K.W.S. De Silva
MSA Samsudeen Dev. (Pvt) Ltd,
#163, Union Place,
Colombo - 02.
Mobile : 071 22 33 888